**විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2020 අංක 8 දරන විධානයන්**

---

## ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 *අති විශේෂ* ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද 2017 අංක 02 දරන විදේශ විනිමය නියෝග (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත 2017 නොවැම්බර් 20 දින නිකුත් කරන ලද 2017 අංක 13 දරන විධානයන් සහ 2018 දෙසැම්බර් 20 දින නිකුත් කරන ලද 2018 අංක 02 දරන විධානයන් සහ නියෝගයන්හි දක්වා ඇති බැර කිරීම් වලට අමතරව, ආමුඛ ආයෝජන ගිණුම් වලට පහත බැරකිරීම් සඳහා පහසුකම් සැලසීමට බලයලත් වෙළෙඳුන් හට මෙමගින් අවසර ලබා දෙනු ලැබේ.

### 2. අවසර ලත් බැර කිරීම්

අ) නියෝග ප්‍රකාරව, ගිණුම් හිමියා ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම් ලත් තැනැත්තෙකු වන අවස්ථාවක දී, විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද 2020 අංක 06 සහ 09 දරන විධානයන් ප්‍රකාරව, එම ගිණුම් හිමියා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන විශේෂ තැන්පතු ගිණුම්වල පොළිය ද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල්පිරීමෙන් ලද මුදල්.

**අතිරේක අධ්‍යක්ෂ**
**විදේශ විනිමය දෙපාර්තමේන්තුව**
2020 ඔක්තෝබර් 07 දින